# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/30 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV)(බී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන සහ 139 වන වගන්ති සමඟ කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත් වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් ඉහත කී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු, ශ්‍රී ලංකා, යාපනය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අංශ නිශ්චිතව දක්වන ලද 2007 ඔක්තෝබර් මස 09 වන දින අංක 1518/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (කලින් කලට සංශෝධිත පරිදි වූ) පළ කරන ලද නියමයේ උපලේඛනය, එහි 1 වන තීරයේ දැක්වෙන "ඉංජිනේරු පීඨය" යන අයිතමයට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන "4. අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම (2012 දෙසැම්බර් මස 05 වන දින අංක 1787/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති) පහත දැක්වෙන සටහන එකතු කිරීම මගින්, සංශෝධනය කරනු ලැබේ :-

"5. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය."

**ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත්,**
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0076

1A - PG 5919 — 457 (2022/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*